05

Samōdhāna: The Journal of Faculty of Social Sciences and Humanities
2018, Vol. 7 (I) 55-83pp
© The Author 2018
Ed. *Chandana Rohana Withanachchi*
Pub. *Publication Section of the Faculty of Social Sciences & Humanities, Rajarata University of Sri Lanka, Mihintale.*
ssh.samodhana@gmail.com

# සෙංකඩගල මහනුවර ප්‍රදේශයේ පැරණි ම බෞද්ධ විහාර ආරාම

පියතිස්ස සේනානායක[1]

## Abstract

This study attempts to measure the ancient history of the Buddhist monasteries and the temples located in the Kandy District of Sri Lanka. The methodology is based on library survey and field survey. The chronological context of this research is extending from 6th centaury B.C to 16th century A.D. Archaeological explorations were carried out on the basis of geographical information systems. Some Buddhist sites have been emerged during the Pre-christian period. The Brahmi inscriptions have a vital significant in arguving the historical importance of ancient sites. Some other places indicate late historic or middle historical evidences. Some others depend on folklore or legends. Future Archaeologists could be able to decide their actual historical value under the multidisciplinary research methods. Therefore authorized institutions should need a proper plan to protect these sites.

**Key Words**: Kandy District, Buddhist Monasteries, Archaeological Evidance, Archaeological Exploration

[1] *ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය*

**හැඳින්වීම**

සෙංකඩගල මහනුවර හා ඒ අවට ප්‍රදේශයෙහි ඇති පැරණි ම බෞද්ධ විහාර හා ආරාම පිළිබඳ ව මූලික හඳුන්වා දීමක් කිරීම මෙම ලිපියේ අරමුණයි. මෙහි දී විශේෂයෙන් ම පළමුවන විමලධර්මසූරිය රජුගේ කාලයේ (ක්‍රිස්තු වර්ෂ 1753) දී සිදු වූ ශ්‍යාමෝපාලි මහා නිකායේ උපසම්පදා මංගල්‍යයට පෙර සිට පැවත එන පූජනීය ස්ථාන පිළිබඳ ව පමණක් සාකච්ඡා කිරීමට නියමිත ය. එබැවින් එම කාලයට පෙර ආරම්භ වූයේ යැයි විශ්වාස කළ හැකි ස්ථානවලට පමණක් අවධානය යොමු කිරීමට සිදුවිය.

**විමර්ශනය**

බුදුදම ක්‍රිස්තු පූර්ව 6 වන සියවසේ උතුරු ඉන්දියාවේ දී උපත ලැබූවකි. බුදුසසුන බොහෝ කාලයක් ශ්‍රී ලංකාව තුළ නොනැසී පවත්නා බවත්, එබැවින් බුදුන් වහන්සේ තුන්වරක් තමන් ම මේ දිවයිනට පැමිණ මේ දිවයින පාරිශුද්ධත්වයට පත් කළ බවත් වංසකතාවල අවධාරණය වේ (දීපවංස I: 17-28,45-80, II: 2-69; මහා වංස I: 19-84, VII: 2-8). බුදුන් වහන්සේ මෙහි කළ සංචාරයන්හි දී ස්ථාන 16 නැවතී සිටි බවත් ඒවා සොළොස් මහා පූජනීය ස්ථාන නමින් සියළු බෞද්ධයන්ගේ වන්දනයට පාත්‍ර වී ඇති බවත් ප්‍රකට ය (සමන්තපාසාදිකා.: 70-71; වංසත්ථප්පකාසිනී : 79-8, 188-189). දිවයිනේ මුල් ම බෞද්ධ පූජනීය ස්ථාන වන මේවායින් කිසිවක් සෙංකඩගල මහනුවර ප්‍රදේශය තුළ ස්ථානගත වී නැති බව පෙනේ. දැනට මෙම ප්‍රදේශය තුළ සොයාගෙන ඇති පැරණි බෞද්ධ සිද්ධස්ථාන සියල්ල ක්‍රිස්තු පූර්ව 3 වන සියවසේ පමණ සිදු වූ මහින්දාගමනයට වඩා පූර්ව කාලයකට අයත් නොවන බව පෙනේ. මේ කාලයේ දී භික්ෂූන් වහන්සේලා සඳහා ගල්ගුහා කටාර කොටවා සකස් කරදීම ජනප්‍රිය වන්නට ඇතැයි සිතිය හැකි ය. මහින්දාගමනයට පෙරත් බුදුදහම පිළිබඳ කිසියම් දැනුමක් ශ්‍රී ලංකා වාසීන්ට තිබුණු බව ප්‍රකට ය. එහෙත් රාජ්‍ය අනුග්‍රහ ලබා දිවයින පුරා බුදු දහම පැතිර යාම මහින්දාගමනයෙන් පසුව සිදු වූ බව පිළිගැනේ (රාහුල හිමි 1962: 52-64). නමුත් මෙම ගල්ගුහා කටාර කොටා වාසයට සුදුසු පරිදි සකස් කිරීමේ දැනුම මුල් ම යකඩ භාවිතා කළ (ප්‍රොටො ඓතිහාසික) යුගයේ සිට ශ්‍රී ලංකා වාසීන් සතුව තිබුණු බව පිළිගැනේ (සෙනෙවිරත්න 1984). බුදු දහම පැමිණීමට පෙර ජෛනාගමේ ධර්මදූතයන් මේ දිවයිනට පැමිණ සිටින්නට ඇති බවත්, ඇතැම්

විට මෙම පැරණි ම ගල්ගුහාවලින් කොටසක් හෝ ජෛන භික්ෂූන් සඳහා වාසස්ථාන වී තිබෙන්නට ඇති බවත් සාකච්ඡා වී තිබේ (ආර්යසිංහ 1965; සේනානායක 2002).

ඓතිහාසික මූලාශ්‍රය වලින් මෙම ප්‍රදේශයේ විහාරස්ථාන පිළිබඳ ව අපට ලබාගත හැක්කේ ඉතාමත් අඩු තොරතුරු ප්‍රමාණයක් බව කිවයුතු වේ. එබැවින් පුරාවිද්‍යා සාධක කෙරේ වැඩි විශ්වාසයක් තබා කටයුතු කිරීමට සිදුවීම අනිවාර්ය විය. දිවයිනේ වෙනත් ප්‍රදේශවල මෙන් ම, මෙම ප්‍රදේශයේ විහාරස්ථාන පිළිබඳ ව ද බොහෝ පුරාවෘත්ත හා ජනප්‍රවාද ගොඩනැගී පවතී. මෙයට පෙර ඒ ස්ථාන සම්බන්ධයෙන් ලියූ අය වැඩි වශයෙන් එබඳු පුරාවෘත්තගත තොරතුරු පාදක කර ගනිමින් තම අදහස් ප්‍රකාශ කර තිබෙන බව දක්නට ලැබේ. ප්‍රබල ඓතිහාසික හෝ පුරාවිද්‍යා සාධක කිසිවක් නොමැති නම් අතීතයට අයත් ස්ථානයක් පිළිබඳ ව නිශ්චිත නිගමනයකට එළඹීම අපහසු ය. බොහෝ පුරාවිද්‍යාඥයෝත් ඉතිහාසඥයෝත් පුරාවෘත්ත, ඉතිහාසගත සිදුවීම් ලෙස පිළිගැනීම ප්‍රතික්ෂේප කරති (පෙරේරා 1964; 46-72; වික්‍රමසිංහ 1961: 5-9). මෙයින් අදහස් වන්නේ සියළු ම ජනශ්‍රැති බැහැර කළ යුතු බව නොවේ. පුරාවෘත්ත, පුරාවෘත්ත ලෙසත් ඓතිහාසික කරුණු, ඓතිහාසික කරුණු ලෙසත් ඉතා ප්‍රවේශමෙන් වෙන් කොට ගෙන පරිහරණය කළ යුතු බවයි.පුරාවෘත්තවල ඇතුළත් කරුණු වුවත් හොඳ ඉවසීමකින් හා දැඩි විනයකින් යුක්ත ව, ඓතිහාසික සහ පුරාවිද්‍යා සාධක සමඟ හරිහැටි සංසන්දනය කර බලා නිවැරදි දැයි නිගමනයකට එළැඹීමට ඇති ඉඩකඩ බොහෝ ය. මේ සඳහා ඉතා සුදුසු නිදර්ශනයක් ඉදිරිපත් කළ හැකි ය. දෙවනපෑතිස් රජුගේ කාලයේ දී බෝධි අංකුර සෙංකඩගල මහනුවර ප්‍රදේශයේ විහාරස්ථාන කීපයක ද පිහිටු වූ බව බෞද්ධ ජනතාවගේ පිළිගැනීමයි. සුළු බෝධිවංසය, චුල්ලබෝධිවංසය වැනි මෑත කාලීන ව ලියැවුණු බෝධිවංස ග්‍රන්ථවල සඳහන් වන තොරතුරු මේ අදහස්වලට පාදක වන්නට ඇත. එහෙත් ශ්‍රී මහ බෝධිය පිළිබඳ තොරතුරු කියන වඩාත් පැරණි ම ග්‍රන්ථවල ඒ තොරතුරු ඇතුළත් වන්නේ නැත. දීපවංස, මහාවංස හා පාළි මහා බෝධිවංස යන ග්‍රන්ථ කතුවරුන් දැන නොසිටි කරුණු දෙවනපෑතිස් රජුගේ කාලයට වඩා බොහෝ පසු කාලයක ජීවත් වූ සුළුබෝධිවංස, චුල්ලබෝධිවංස වැනි ග්‍රන්ථ කතුවරුන් දැනගත්තේ කෙසේ දැයි පැහැදිලි කිරීම අපහසු ය. පුරාවිද්‍යා

සාක්‍ෂිවල වැදගත්කම ඉස්මතු වන්නේ මෙබඳු තැනක දී ය. ගෝනාවත්ත යනු එලරුහ බෝධියක් පිහිටි තැනක් බව සුළුබෝධිවංසය කියයි. ක්‍රි.පූ. යුගයට අයත් බ්‍රාහ්මී ලිපි එහි තිබී හමුවී ඇත (පරණවිතාන 1970: අංක 813). එහෙත් ඒ ලිපිවලින් දෙවනපෑතිස් රජු පිළිබඳ ව කිසිදු තොරතුරක් හමු නොවේ. නමුත් ඒවා දෙවනපෑතිස් රජුගේ කාලයට වුව ද අයත් කළ හැකි ක්‍රි.පූ. බ්‍රාහ්මී ලිපි වීම, නොසලකා හළනොහැකි ප්‍රබල පුරාවිද්‍යා සාධකයක් බව කිවයුතු වේ. නූතන විද්‍යාත්මක පුරාවිද්‍යා කැණීම් හා කාලනීර්ණ ක්‍රම මගින් ඒ ස්ථානය පිළිබඳ ව නිශ්චිත නිගමනයක් ප්‍රකාශ කිරීමට අනාගත පුරාවිද්‍යාඥයන්ට හැකිවන බව විශ්වාස කරමු.

මහනුවර සෙංකඩගල ප්‍රදේශයේ ඇති පැරණි යැයි කියන විහාරස්ථාන පුළුල් පුරාවිද්‍යා පර්යේෂණයන්ට මෙතෙක් භාජනය වී නැත. එබැවින් අනාගතයේ දී මෙම ප්‍රදේශය තුළ විධිමත් පුරාවිද්‍යා පර්යේෂණ අනිවාර්යයෙන් ම සිදුකළ යුතු ව පවතී. එතෙක් ඒ ස්ථාන ආරක්ෂා කර තබා ගැනීම ඒවා භාර ව සිටිනා භික්ෂූන් වහන්සේලාගේත්, සෙසු බෞද්ධ ජනතාවගේත්, රජයේත් යුතුකම වන්නේ ය. මෙහි දී පුරාවස්තු නැතිනම්, පුරාවිද්‍යා ශේෂ යනු මොනවා දැයි ශ්‍රී ලංකාවේ ජීවත් වන බොහෝ දෙනා නිසි ලෙස තේරුම්ගෙන නැති බව පෙනේ. එබැවින් ඒ ගැන යමක් සඳහන් කිරීම සුදුසු ය.

කිසියම් පැරණි ස්ථානයක් හඳුනා ගැනීමේ දී මෙතෙක් සැලකිල්ලට භාජනය කරනු ලැබූ සාධක රාශියක් පිළිබඳ ව සඳහන් කළ හැකි ය. ඒවා අතර කටාර කෙටූ ගල්ගුහා, ශිලා ලිපි ඇතුළු සියළු ම අභිලේඛන, පැරණි මූර්ති හා චිත්‍ර ශේෂ, පැරණි ස්තූප, සිරිපතුල් සටහන්, ආසන ඝර, බෝධි ඝර, පධාන ඝර, පැරණි මැටි භාජන කැබලි මෙන් ම ගඩොළු කැබලි සහ වෙනත් වාස්තුවිද්‍යා අවශේෂ ආදී බොහෝ දේ පවතී. මීට අමතර ව ඉතාමත් නූතන පුරාවිද්‍යා විධික්‍රම මගින් අදාළ ස්ථානයේ පස්, දිරාපත් වූ දැව, ඇටකටු කැබලි, මඩ රැස්වූ ස්ථාන, අඟුරු අළු වැනි බොහෝ දේ භාවිතා කර ඒ ස්ථානයේ අතීතය පිළිබඳ ව නිශ්චිත කරුණු ප්‍රකාශ කළ හැකි බව සොයා ගෙන තිබේ (බ්‍රෝත්වෙල් සහ හිග්ස් 1963; බීයර්ස් 1992).

එබඳු වඩාත් සූක්ෂම පුරාවිද්‍යා පර්යේෂණ ශ්‍රී ලංකාව තුළ වර්තමානයේ සිදුවන්නේ ඉතාමත් අව ම වශයෙන් බව ද සඳහන් කළ යුතු ය. ඊට හේතුව ඒ සඳහා අවශ්‍ය විද්‍යාගාර පහසුකම්, පුහුණු විද්‍යාඥයන් සහ මූල්‍ය ශක්තිය අතින් අපේ රට තවමත් ඉතා දුර්වල තත්ත්වයක පැවතීම ය. මෙම වර්තමාන තත්ත්වය අනාගතයේ වෙනස් වීමට බොහෝ දුරට ඉඩකඩ පවතී. ඒ නිසා පුරාවිද්‍යාඥයන්ගේ උපදෙස් නොතකා පැරණි විහාරස්ථාන ආශ්‍රිත ව නූතනයේ කරනු ලබන පස් කැපීම්, පොළොව සෑරීම්, පස් ඉවත් කිරීම්, පොළොව මට්ටම් කිරීම් ආදිය මුළුමනින් ම නවතා දැමිය යුතු බව තදින් ම අවධාරණය කරමු. ඊට හේතුව එබඳු කටයුතු නිසා වර්තමානයේ ජීවත්වන අප කිසිසේත් ම නොසිතන ආකාරයේ වටිනා පුරාවිද්‍යා සාධක සම්භාරයක් විනාශ වී යා හැකි නිසා ය. කිසියම් පුරාවිද්‍යා සාක්ෂියක් අපට අහිමි වුව හොත්, එය අහිමි වන්නේ සදහට ම ය. අප කොතරම් ධනවත් වුවත්, කොතරම් බලවත් වුවත් එම පුරාවිද්‍යා සාධකය කිසි දා නැවත නිර්මාණය කළ නොහැකි ය. එබැවින් එම පූජනීය ස්ථාන භාර ව ඉන්නා ස්වාමීන් වහන්සේලාත්, දායක සභාවේ අයත් මේ පිළිබඳ ව තමන්ගේ දැඩි අවධානය යොමු කිරීම සුදුසු ය.

මෙම ලිපියට ඇතුළත් වන සියළු ම ස්ථානවලට පෞද්ගලික ව ම යාමටත් ඒ තැන්වල ඇති සියළු ම පුරාවස්තු පෞද්ගලික ව ම පරීක්ෂා කර බැලීමටත් මෙම ලේඛකයාට අවස්ථාව නොලැබුණු බව සඳහන් කළ යුතු වේ. ඒ අතර මෙයට පෙර එම ස්ථාන ආශ්‍රිත ව පර්යේෂණ කළ අය පුරාවිද්‍යා සාධක මොනවා දැයි හරිහැටි තේරුම් ගෙන ඒවා වාර්තා කර නැති බව දක්නට ලැබේ. ගල්ගුහාවක් තිබේ නම්, එහි කටාර කොටා තිබේද නැත්ද යන්න සඳහන් කිරීම අත්‍යවශ්‍ය ම කරුණකි. ශිලාලිපියක් ඇත්නම්, බිතුසිතුවම් ඇත්නම්, ඒවා කුමන කාලයකට අයත් දැයි අනුමාන වශයෙන් හෝ සඳහන් කිරීම ඉතා වැදගත් ය. නමුත් රජයේ පුරාවිද්‍යා නිලධාරීන් පවා ඇතැම් විට එබඳු පුරාවිද්‍යා සාධක නොසලකා හැර තිබේ. "උඩදුම්බර ගන්දෙකේ කෝරලයේ උඩවෙල ගමේ ලෙන් විහාරයක් ඇත. පැරණි චිත්‍ර එහි දක්නට ඇත. ප්‍රතිමා අලුත්වැඩියා කරවා ඇත." මෙය පුරාවිද්‍යා කොමසාරිස් විසින් 1964-65 වර්ෂය සඳහා පළ කළ වාර්තාවේ 29 වන පිටුවේ පුරාවිද්‍යා ස්ථානයක් හඳුන්වා දීම සඳහා ලියන ලද්දකි. මෙබඳු අවිද්‍යාත්මක වාර්තා පළ කිරීමට නම් රජයේ මුදල් වියදම් කර පුරාවිද්‍යාඥයන් එහි යාමට අවශ්‍ය නැත. ගල්ගුහාව

කටාර කෙටූ එකක්ද පැරණි චිත්‍ර අයත් විය හැකි කාලය දළ වශයෙන් කුමක්ද යන්න වත් අඩු තරමින් සඳහන් කරන්නට හැකියාව ඔවුන්ට තිබුණි. එහෙත් ඔවුන් අතින් එය ඉටුවී නැත. මේ අනුව උඩවෙල ලෙන් විහාරයේ ඉතිහාසය පිළිබඳ යම් පැහැදිලි අදහසක් ප්‍රකාශ කිරීමට නම් අව ම වශයෙන් එහි යාමට සිදුවීම නොවැළැක්විය හැකි ය.

ශ්‍රී ලංකාවේ පැරණි විහාරස්ථාන පිළිබඳ ව පර්යේෂණ කරන අයට පරිශීලනය කිරීමට සිදුවන්නේ මෙබඳු මූලාශ්‍රයයෝ ය. එබැවින් නිශ්චිත ව ම අදහසක් ප්‍රකාශ කළ යුතු තැන්වල දී විවිධ පොත්පත්, ලිපිලේඛන වාර්තා ආදියේ කෙබඳු දේ ඇතුළත් වුවද පෞද්ගලික ව ම ඒ ස්ථානය පරීක්ෂා කර බලා තීරණයකට එන්නට සිදුවීම අනිවාර්ය විය. මෙම ලිපිය සම්පාදනය කිරීමේ දී මුහුණ දුන් මූලාශ්‍ර පරිහරණය පිළිබඳ ගැටළුවේ ස්වභාවය එබඳු ය.
ක්‍රිස්තු පූර්ව යුගයට අයත් යැයි නිශ්චිත ව ම තීරණය කළ හැකි කටාර කෙටූ ගල් ගුහා සහ පූර්ව බ්‍රාහ්මී ලිපි සහිත පුරාවිද්‍යා ස්ථාන ගණනාවක් ම මහනුවර සෙංකඩගල ප්‍රදේශය තුළ පිහිටා තිබෙන බව වාර්තා වේ. වේගිරිය, දුල්වල, මොලගොඩ, ගෝනා වත්ත, බඹරගල, ගලබාව යනු ඒවා ය (පරණවිතාන 1970 : අංක 807, 808, 809, 810,811, 812, 813, 814, 815, 816, 817; නිකලස් 1979 : 135).මීට අමතර ව දස්කර කුට්ටන්ගලේ ලෙන් විහාරය සහ කටාරන්ගල රජමහා විහාරය යන තැන්වල ද බ්‍රාහ්මී ශිලාලිපි ඇති බව එච්.එම්.එස්. තුන්දෙණිය ප්‍රකාශකර තිබේ (1986 : 164; 1990 : 6). මේ අදහස තවදුරටත් විමසා බැලිය යුතු එකකි. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කළ පරීක්ෂණවල දී ගල්මඩුව ගෙඩිගේ විහාරය සහ ගුරුදෙණිය යන ස්ථානවල දී පැරණි බ්‍රාහ්මී අක්ෂර සහිත ගඩොළු හමුවී තිබේ (පුරාවිද්‍යා කොමසාරිස් 1964-65: 15; පැරණි ස්මාරක 1972:402, 408). චූලනී රඹුක්වැල්ලගේ සහාය ඇතිව (1997) අකුරණ බමුණුපොළ ගම්මානයේ ඇති අමුණේවෙල විහාරය පරීක්ෂා කළ අවස්ථාවේ දී මෙම ලේඛකයාට පැහැදිළි වූයේ සෙංකඩගල ප්‍රදේශයේ ඇති ඉතාමත් පැරණි ම බ්‍රාහ්මී ලිපියක් එහි ඇති කටාර කෙටූ ගුල් ගුහාවේ සටහන් වී තිබෙන බවයි. එම ලිපියේ කොටසක් මහනුවර රාජධානි සමයේ ඉදිකළ විහාර මන්දිරයේ බිත්තියට යට වී ඇත. ඒ නිසා කියවාගත හැක්කේ ලිපියෙන් කොටසක් පමණි. මෙහි **පරුමක** යන ආරම්භක වචනයේ මුල් ම අක්ෂරය වන **ප** උඩයට මාරුවන පරිදි සටහන් කර,

ඊට උඩින් තිත් සටහනක් පැහැදිළි ව ම යොදා ඇත. එබැවින් ශ්‍රී ලංකාවේ පුරාක්ෂර විද්‍යාව පිළිබඳ ව පර්යේෂණ කරන අයට එම ලිපියේ ඇති වැදගත්කම අප්‍රමාණ ය. මෙම ගල් ගුහාව එතරම් උස් නොවූ ඉතා කුඩා ප්‍රමාණයේ එකකි. ඒ නිසා ම එය බොහෝ දෙනා විසින් නොසලකා හරිනු ලැබූ ස්ථානයක් විය.

ඉහත සාකච්ඡා කළ පැරණි බ්‍රාහ්මී ලිපි සහිත ස්ථාන හැරුණු විට මෙම ප්‍රදේශයේ ඇති කටාර කෙටූ ගල් ගුහා ඇති ස්ථාන ද පුරාවිද්‍යාත්මක වශයෙන් ඉතා වැදගත් වේ. හේතුව එම ගල් ගුහා අතීතයේ කරවූ බෞද්ධ විහාර ආරාම අතර ප්‍රධාන තැනක් ගනු ලැබූ (පරණවිතාන 1970: i-vii) නිසා ය. ගන්නෝරුව රජමහා විහාරය, රණවන විහාරය, අමුණුපුර ලෙන්විහාරය, උඩුරාවණ ශ්‍රී රාම විහාරය, දොරගමුවේ විහාරය, චන්ද්‍රමුඛී ලෙන් විහාරය, හිඳගල ලෙන් විහාරය, මාපනාවතුර ලෙන් විහාරය, දියකෙළිනාවෙල රජමහා විහාරය, එගොඩගම මාළිගාතැන්න, කටාරන්ගල රජමහා විහාරය, උඩුවාවල පුරාණ විහාරය, හපුගොඩ ලෙන් විහාරය, දුල්වල සෝමගිරි විහාරය, ගල්ලෑල්ල රජමහා විහාරය, කොලුගල රජමහා විහාරය, ගුණදාහ ලෙන් විහාරය, මැදගොඩ රජමහා විහාරය, ගම්පළ සිංහපිටියේ ලෙන් විහාරය, දේදුනුපිටියේ ලෙන් විහාරය, නියංගොඩ පුරාණ විහාරය, පට්ටපොළ ගල්ලෙන් විහාරය, වෙලගම ගල්ලෙන් විහාරය, රත්මල්කඩුව බෝධිරුක්ඛාරාමය, සියඹලාපාය කොහොඹා දේවාලය, දෙගල්දොරුව රජමහා විහාරය, කයිකාවල, උඩවෙල ගල්ලෙන් විහාරය, බුලුගස් තැන්න සිසිල් පැන්වල විහාරය, වේරවල සීමාරාමය, දස්කර කුට්ටන්ගලේ ලෙන් විහාරය, නියම කන්දේ පිරිවෙන, කුඹල්ඔලුව පුරාණ විහාරය, නිකහැටියේ විහාරය, ගල්ලෙන්ගොල්ලේ විහාරය, පින්නගොල්ලේ ලෙන් විහාරය, උරුලෑවත්තේ විහාරය, කළුගල කලව්ට් ලෙන, පමුණුතෙන්න, දළදාගම මාළිගා විහාරය, නුගේතැන්න කන්දේ දේවාලය, උඩගෙදර වත්තේ ගල්ලෙන, මාළිගාතැන්න, උඩවත්තකැලේ ගල්ලෙන් යන ස්ථානවල එබඳු ගල් ගුහා දැකගත හැකි වේ (පුරාවිද්‍යා කොමසාරිස් 1993: 17; 1940-45 : 43; 1964-65 : 28-29; 1967-67 : 33; පැරණි ස්මාරක : 419, 421, 444, 448, 449; සාරානන්ද හිමි සහ සරණංකර හිමි 1966 : 212-266; තුන්දෙණිය 1986a : 1986b; 1988a; 1988b; 1990a; 1990b; 1990c; 1990d).

මෙයින් ඇතැම් ඒවා දැනට විහාරස්ථාන ලෙස භාවිතයට නොගැනෙන බව දක්නට ලැබේ. එහෙත් ඒවා පැරණි බෞද්ධ භික්ෂූන් වහන්සේලා වාසය කළ ස්ථාන විය හැකි බව ඒ ආශ්‍රිත ව දක්නට ලැබෙන පැරණි කටාර කෙටූ ගල් ගුහාවලින් පැහැදිලි වේ. එසේ ම මෙයින් වැඩි ප්‍රමාණයක සෙංකඩගල රාජධානියේ අවසාන කාල පරිච්ඡේදයේ (විශේෂයෙන් ම කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ක්‍රි.ව. 1747-1780 අවධියේ සහ ඉන් පසුව) ඉදි වූ විහාරස්ථාන දක්නට ලැබේ. ඒ විහාරස්ථාන පසු කාලීන ඒවා වුවත්, ඒවා පිහිටුවීමට පසුබිම් වූ කටාර කෙටූ ගල් ගුහා ඊට වඩා බොහෝ ඈත අතීයකට නෑකම් කියන බව විශ්වාස කිරීමට පිළිවන. එහෙයින් මේවා මහනුවර සෙංකඩගල ප්‍රදේශය ආශ්‍රිත ව පිහිටි පැරණි ම බෞද්ධ පුරාවිද්‍යා ස්ථාන ලෙස පිළිගැනීම අපහසු නැත.

මෙයින් පසුව සාකච්ඡා කිරීමට සිදුවන්නේ නොයෙකුත් වාද විවාදයන්ට තුඩුදිය හැකි, අනුරාධපුර රාජධානියේ සිටි රජවරුන් විසින් ආරම්භ කළේ යැයි විවිධ පසු කාලීන ග්‍රන්ථවලත් (පූජාවලිය, රාජාවලිය, සූළුබෝධිවංසය, චූළබෝධිවංසය, කඩඉම් පොත්) විවිධ පුරාවෘත්ත හා ජනප්‍රවාදවලත් සඳහන් වන ස්ථාන පිළිබඳ ව ය. ඒ අනුව ස්ථාන කීපයක් විමසා බැලුවහොත් දෙවනපෑතිස් රජුගේ කාලයට (ක්‍රිස්තු පූර්ව 250-210) අයත් වන ස්ථාන ලෙස පුරාවෘත්තවල සඳහන් වන්නේ ගන්නෝරුව රජමහා විහාරය, දන්තුරේ රජමහා විහාරය, දෙහිපාගොඩ රජමහා විහාරය, ඉළුපැන්දෙණිය රජමහා විහාරය, ගල්දොළ අසෝකාරාමය, නියම්ගම්පාය රජමහා විහාරය, මැණික්දිවෙල රජමහා විහාරය, සිරිමල් වත්ත රජමහා විහාරය, උඩවත්ත කැලේ ගල්ලෙන්, සෙංකඩගල නාථ දේවාල විහාරය, ගෝනාවත්ත විහාරය (සාරානන්ද හිමි සහ සරණංකර හිමි 1956) යන විහාරස්ථානයෝ ය. ඉන් පසු ව දුටුගැමුණු රජුගේ කාලයට (ක්‍රිස්තු පූර්ව 161-137) අයත් යැයි කියන ස්ථාන අතරට ගැටඹේ උපසම්පදා තොටුපල බෝධිය, වෙහෙරගල කන්දේ ස්තූපය වැනි තැන් ඇතුළත් කර තිබේ. වලගම්බා රජුගේ (ක්‍රි.පූ. 103-77) කාලයට අත්තරගම පොත්ගුල් විහාරය, ගල්ලැල්ල රජමහා විහාරය, කටාරන්ගල රජමහා විහාරය, ගුණදාහ ලෙන් විහාරය, ගෝනිගොඩ ලෙන් විහාරය, කොලුගල රජමහා විහාරය, දියකෙළිනා වෙල රජමහා විහාරය, නිකහැටියේ රජමහා විහාරය, වෙලගම ගල්ලෙන් විහාරය, මැදගොඩ රජමහා විහාරය, මැදවල රජමහා

විහාරය, හිඳගල රජමහා විහාරය, අලවතුගොඩ දේවාලය ආශ්‍රිත විහාරය යන විහාර අයත් වන බව අසන්නට ලැබේ.

එහෙත් මෙම ස්ථාන ආශ්‍රිත පුරාවෘත්ත හා ජනප්‍රවාද හැරුණු විට ඒ ඒ රජවරුන්ගේ කාලවල දී නිශ්චිත ව ම ඒවා ඉදි වූ බව තහවුරු කිරීම සඳහා අවශ්‍ය පැහැදිලි ඓතිහාසික හෝ පුරාවිද්‍යා සාක්ෂි කිසිවක් ඒ තැන්වලින් තවමත් වාර්තා වී නැති බව කිවයුතු වේ. ගෝනාවත්ත විහාරය ආශ්‍රිත ව පැරණි බ්‍රාහ්මී ලිපියක් හමුවී ඇති බවත්, ඒ ලිපිය කටාර කෙටූ ගල් ගුහාවක සටහන් වී ඇති බවත් (පරණවිතාන 1970: අංක 813) ඉහත සඳහන් විය. එම ලිපිය ක්‍රිස්තු පූර්ව කාල පරිච්ඡේදයට අයත් වන බවට කිසිදු විවාදයක් නැත. එසේ ම එහි සඳහන් වන මචුඩික රජ, රජ අබය, රජ නග සහ රජ රජ අබය යන රාජ පරම්පරාව ඉතාමත් පැරණි ප්‍රාදේශීය රජ පවුලක් බවත් (ගුණවර්ධන 1985: 1-39) සාකච්ඡාවට භාජනය වී තිබේ. එහි දෙවනපෑතිස් රජු සම්බන්ධ කිසිදු තොරතුරක් ඇතුළත් වන්නේ නැත. එහෙයින් ඒ ලිපියේ ඇතුළත් කරුණු පදනම් කරගෙන එම ස්ථානය දෙවනපෑතිස් රජුගේ කාල පරිච්ඡේදයට අයත් වන බව නිශ්චිත ව ම ප්‍රකාශ කළ නොහැකි ය. කටාර කෙටූ ගල් ගුහා සහ ක්‍රිස්තු පූර්ව යුගයට අයත් කළ හැකි බ්‍රාහ්මී අක්ෂර යන කරුණු ඉතා ප්‍රබල පුරාවිද්‍යා සාධක වේ. ඒවා පදනම් කරගෙන එය දෙවනපෑතිස් රජුගේ කාලයට සමීප කාලයක දී ආරම්භ වන්නට ඇති බව අනුමාන වශයෙන් තීරණය කළ හැකි ය. හිඳගල රජමහා විහාරය වලගම්බා රජුගේ කාලයේ (ක්‍රිස්තු පූර්ව 103-77) දී ආරම්භ වූවක් බව ප්‍රදේශවාසී ජනතාවගේ පිළිගැනීම වුවද (තුන්දෙණිය 1988a : 283) ඒ බව සනාථ කිරීම සඳහා කටාර කෙටූ ගල් ගුහා හැරුණු විට වෙනත් කිසිදු පුරාවිද්‍යා සාක්ෂියක් තවමත් ලැබී නැති බව සඳහන් කළයුතු වේ. ක්‍රිස්තු වර්ෂ 6-7 සියවස්වලට අයත් කළ හැකි අභිලේඛනත් බිතුසිතුවම් ශේෂත් එහි දී හමුවන නිසා (පරණවිතාන 1958 : 1-5; නිකලස් 1979 : 138) ඒ විහාරයේ ආරම්භය පිළිබඳ නිශ්චිත තොරතුරු ප්‍රකාශ කළ හැක්කේ ක්‍රි.ව. 6-7 සියවස්වල සිට බව කිව යුතු ය. කටාර කෙටූ ගල් ගුහා ඇති නිසා ක්‍රිස්තු පූර්ව යුගයේ සිට මෙහි භික්ෂූන් වහන්සේලා වාසය කළ බව අපට බොහෝ දුරට අනුමාන කිරීමට පමණක් පිළිවන. මෙහි දී දෙවනපෑතිස් රජුගේ කාලයේ දී සිදු වූ එළරුහ බෝධි රෝපණයත්, බෝධාහාර පරම්පරාවත් පිළිබඳ ව කිසියම්

ඉගියක් හිඳගල එක් ශිලා ලිපියකින් ප්‍රකාශ වන බව (පරණවිතාන 1958 : 1-5) ද අප අමතක නොකළ යුතු ය. එහෙත් ඒ මතය නිශ්චිත ලෙස ම පිළිගැනීමට නම් ඒ සඳහා වෙනත් ප්‍රබල පුරාවිද්‍යා හෝ ඓතිහාසික සාක්ෂි ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය ය.

මැදවල රජමහා විහාරය පිළිබඳ ඉතිහාසය ද සාකච්ඡාවට භාජනය කළ යුතු තවත් හොඳ ම නිදර්ශනයකි. මෙම විහාරය වලගම්බා රජුගේ කාලයේ (ක්‍රි.පූ. 1 වන සියවසේ) දී ආරම්භ කළ ස්ථානයක් බව ප්‍රකාශ වන්නේ ක්‍රි.ව. 1821 පමණ ලියවුණු සුළුරාජාවලියේ (1959 : 48) සහ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාලයේ (18 වන සියවසේ දී) ලියැවුණු තඹ සන්නසක ය (ධම්මානන්ද හිමි 1969 : 264-265). වලගම්බා රජු රජ කළ කාල පරිච්ඡේදයත් කීර්ති ශ්‍රී රාජසිහ රජු රජ කළ කාල පරිච්ඡේදයත් අතර පරතරය වර්ෂ එක්දහස් අටසීයක් තරම් අති දීර්ඝ වූවකි. එබැවින් ඒ තඹ සන්නසේ ඇතුළත් කරුණු පමණක් ආධාර කර ගනිමින් ඒ ගැන තීරණයකට එළැඹීම අපහසු ය. අඩු තරමින් හිඳගල රජමහා විහාරයේ තිබුණු ආකාරයේ ක්‍රිස්තු පූර්ව යුගයට අයත් යැයි සිතිය හැකි කටාර කෙටූ ගල් ගුහාවක් හෝ එහි පිහිටා තිබුණේ නම්, වලගම්බා රජුගේ කාලයට අයත් ය යන අදහසට අනුමාන සාක්ෂියක් එයින් සැපයෙන්නට ඉඩකඩ තිබුණි. මෙබඳු අවස්ථාවක මැදවල රජමහා විහාරය පිළිබඳ ඉතිහාසය කථාවේ සත්‍යය එම විහාරස්ථානය අවට ප්‍රදේශයේ පොළව යට සැඟවී තිබෙන්නට පිළිවන් බව කල්පනා කිරීම සුදුසු ය. මෙබඳු විහාරස්ථාන අවට භූමි ප්‍රදේශවල විධිමත් පුරාවිද්‍යා කැණීම් අනාගතයේ කවදා හෝ සිදුවන තුරු ඒවා ආරක්ෂා කළ යුතු යැයි පුරාවිද්‍යාඥයන් ප්‍රකාශ කරන්නේ එහෙයිනි. එම පුරාවිද්‍යා පර්යේෂණ අප ජීවත්වන කාලය තුළ දී ම සිදුවිය යුතු යැයි සිතතොත් ඒ වරදකි. අපට වඩා දක්ෂ පුරාවිද්‍යාඥයන් අනාගතයේ දී බිහිවනු නියත ය. අපේ යුතුකම වන්නේ මේවායේ සැබෑ ඉතිහාසය කවදා හෝ හෙළිදරව් වන තුරු ඒවා ආරක්ෂා කර තැබීම ය. කිසිදු පුරාවිද්‍යා සාධකයක් නැතැයි පොළොව මතුපිට පමණක් පරීක්ෂා කර බලා දැනට නොසලකා හැර තිබෙන බොහෝ තැන්වලින් අනාගතයේ වැදගත් පුරාවිද්‍යා සාධක හමුවීමට බෙහෙවින් ඉඩකඩ තිබේ.

මහනුවර සෙංකඩගල ආශ්‍රිත වෙනත් විහාර ආරාම පිළිබඳවත් ප්‍රකාශ කළ යුත්තේ ඉහත සඳහන් කළ ස්වරූපයේ ම අදහස් බව පෙනේ. එකිනෙක

විහාරස්ථානය පිළිබඳවත් ඒ ඒ විහාරස්ථාන ඉදිකළ රජුන් පිළිබඳවත් තොරතුරු නිවැරදි ව සවිස්තරාත්මක ලෙස සාකච්ඡා කිරීමට මෙය අවස්ථාව නොවේ. එබඳු පුළුල් විස්තරයක් ඉදිරිපත් කිරීමට ගියහොත් පිටු සිය ගණනක ග්‍රන්ථයක් බවට මෙය පත්වනු ඇත. එසේ ම එම ප්‍රදේශය පුරා සංචාරය කර ඒ ස්ථාන පිළිබඳ ව විධිමත් පුරාවිද්‍යා ගවේෂණ කළ යුතු ව පවතී. ඒ සඳහා සැලකිය යුතු කාලයක්, ශ්‍රමයක් හා මුදලක් වැය කිරීමට සිදුවනු නියත ය. එබැවින් පුරාවෘත්තවල ඇතුළත් වන තොරතුරු සමඟ මෙම ලේඛකයා කළ ගවේෂණවල තොරතුරු ද විවිධ පර්යේෂකයන් හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරනු ලැබූ තොරතුරු ද ඇතුළත් කර ඉතාමත් සංක්ෂිප්ත කර සැකසූ මහනුවර සෙංකඩගල ප්‍රදේශයේ විහාරස්ථාන පිළිබඳ නාමාවලියක් මෙම ලිපිය අවසානයේ ඉදිරිපත් වේ. එයින් අදාළ ස්ථාන පිළිබඳ මූලික දැනුමක් පාඨකයාට ලබාගත හැකි වනු ඇත. එහෙත් එය සර්ව සම්පූර්ණ වාර්තාවකැයි සෑහීමකට පත්විය නොහැකි ය. එම ලැයිස්තුවට ඇතුළත් නොවුණු පුරාවිද්‍යාත්මක වශයෙන් ඉතාමත් වැදගත් තවත් විහාරස්ථාන මෙතෙක් ගවේෂණයට භාජනය නොවී, අප්‍රකට ව මහනුවර අවට ප්‍රදේශ තුළ සැඟවී තිබිය හැකි ය.

**සෙංකඩගල මහනුවර ප්‍රදේශයේ පැරණි විහාරස්ථාන පිළිබඳ නාමාවලිය**

| | පූජනීය ස්ථානයේ නාමය | ක්‍රි.ව. 1750ට වඩා පැරණි යයි සිතිය හැකි පුරාවිද්‍යා සාධක | ආරම්භය පිළිබඳ පුරාවෘත්ත |
|---|---|---|---|
| 1 | අත්තරගම පොත්ගුල් විහාරය | සිරිපතුල් සටහන් | වලගම්බා රජු සිටි ස්ථානයකි. |
| 2 | අඹන්පොල පුරාණ විහාරය | සිරිපතුල් සටහන් | - |
| 3 | අම්පිටියේ දිවුරුම් බෝධිමලු විහාරය | - | II පරාක්‍රමබාහු රජු, දේවප්‍රතිරාජ ඇමති. |
| 4 | අමුණුපුර උඩතැන්නේ ලෙන් විහාරය | කටාර කෙටූ ගල් ගුහා | - |
| 5 | අලවතුගොඩ දේවාල විහාරය | - | වලගම්බා රජු |
| 6 | අරත්තන රජමහා විහාරය | ගල්කණු නටබුන් | V විජයබාහු |
| 7 | අස්ගිරි මූලස්ථාන මහා විහාරය | අස්ගිරි තල්පත | IV පරාක්‍රමබාහු |
| 8 | අදාහන මලුව, ගෙඩිගේ විහාරය | 18 වන සියවසේ වාස්තුවිද්‍යා නිර්මාණ, නරේන්ද්‍රසිංහ රජුගේ තඹ සන්නස | III වික්‍රමබාහු |
| 9 | ඇඹිල්මීගම පුරාණ විහාරය | - | වසර 70 පෙර ඉදිවිය. |

| | පූජනීය ස්ථානයේ නාමය | පුරාවිද්‍යා සාධක | ආරම්භය පිළිබඳ පුරාවෘත්ත |
|---|---|---|---|
| 10 | ඇම්බැක්ක දේවාලය ආශ්‍රිත විහාරය | - | ගම්පළ රාජධානි කාලය |
| 11 | ඇල්පිටියේ මනිනාරාමය | සිරිපතුල් සටහන් | ක්‍රි.ව. 1797 දී ඉදිවිය. |
| 12 | ඉඟුරුවත්තේ පුරාණ විහාරය | - | නරේන්ද්‍රසිංහ රජු |
| 13 | ඉළුපැන්දෙණිය රජමහා විහාරය | වාස්තුවිද්‍යා නටබුන් | දෙවනපෑතිස් රජු, කල්‍යාණවතී රැජින |
| 14 | උඩඅලුදෙණිය රජමහා විහාරය | 14 වන සියවසේ ලී කැටයම්, ක්‍රි.ව. 1742 ශිලා ලිපිය | IV භුවනෙකබාහු V පරාක්‍රමබාහු |
| 15 | උඩතලවින්න බෝධිමලු විහාරය | - | නරේන්ද්‍රසිංහ රජු |
| 16 | උඩවෙල ලෙන් විහාරය | කටාර කෙටූ ගල් ගුහා | - |
| 17 | උඩුරාවණ ශ්‍රී රාම පුරාණ විහාරය | කටාර කෙටූ ගල් ගුහා | IV භුවනෙකබාහු සෙනරත් රජු |
| 18 | උඩුවාවල පුරාණ විහාරය | කටාර කෙටූ ගල්ගුහා, ක්‍රි.ව. 1701 ට අයත් තුඩපත | II රාජසිංහ රජු |
| 19 | උනම්බුවේ පුරාණ විහාරය | තුඩපත (ක්‍රි.ව. 1701) සිරිපා සටහන් | - |
| 20 | උපෝසථ පුෂ්පාරාමය, මල්වත්ත මූලස්ථාන මහා විහාරය | පැරණි ස්තූපය | වීරවික්‍රම රජු |
| 21 | උරුලෑවත්ත රජ මහා විහාරය | කටාර කෙටූ ගල් ගුහා | සේනාසම්මත වික්‍රමබාහු රජු |
| 22 | උල්පොතගම කොටවෙහෙර | නටබුන් ස්තූපය හා ගල්කණු | - |
| 23 | එගොඩගම මාළිගාතැන්න | කටාර කෙටූ ගල් ගුහා | - |
| 24 | එගොඩගම ශෛලබිම්බාරාමය | කටාර කෙටූ ගල් ගුහා | - |
| 25 | කටාරන්ගල රජමහා විහාරය | කටාර කෙටූ ගල් ගුහා, XIV සියවසේ පුරාවස්තු | වලගම්බා රජු, මලියදේව රහතන් වහන්සේ |

| | පූජනීය ස්ථානයේ නාමය | පුරාවිද්‍යා සාධක | ආරම්භය පිළිබඳ පුරාවෘත්ත |
|---|---|---|---|
| 26 | කනක්බාරපොල පුරාණ විහාරය | කටාර කෙටූ ගල් ගුහා | I රාජසිංහ රජු |
| 27 | කහටපිටියේ ගංගාතිලක විහාරය | - | II පරාක්‍රමබාහු රජු<br>III වික්‍රමබාහු රජු |
| 28 | කලුගල කලවිටි ලෙන | කටාර කෙටූ ගල් ගුහා | - |
| 29 | කිරින්දේ පුරාණ විහාරය | - | IV භුවනෙකබාහු රජු |
| 30 | කිරිවවුලේ පුරාණ විහාරය | - | ගම්පොල රාජධානි කාලය |
| 31 | කුණ්ඩසාලේ රජමහා විහාරය | වාස්තු විද්‍යා ශේෂ | නරේන්ද්‍රසිංහ රජු |
| 32 | කුඹල්ඔලුව පුරාණ විහාරය | කටාර කෙටූ ගල් ගුහා, සිරිපතුල් සටහන්, වත්හිමි භුවනෙකබාහු රජුගේ ලේඛනය | IV භුවනෙකබාහු රජු |
| 33 | කුල්ලකොටුවේ ශ්‍රී නන්දනාරාමය | සිරිපතුල් සටහන් | - |
| 34 | කුළුගම්මන රජමහා විහාරය | - | IV භුවනෙකබාහු රජු<br>V භුවනෙකබාහු රජු |
| 35 | කොටකේදෙණිය රජමහා විහාරය | සිරිපතුල් සටහන් | I විමලධර්මසූරිය රජු |
| 36 | කොටබෝගොඩ රජමහා විහාරය | - | IV විජබාහු රජු |
| 37 | කොබ්බෑකඩුව රජමහා විහාරය | - | IV භුවනෙකබාහු රජු |
| 38 | කොලුගල රජමහා විහාරය | කටාර කෙටූ ගල් ගුහා | වලගම්බා රජු,<br>III වික්‍රමබාහු රජු |
| 39 | ගඟුල්දෙණිය රජමහා විහාරය | - | IV භුවනෙකබාහු රජු |
| 40 | ගඩලාදෙණිය බෝධිරාජාරාමය | - | ගම්පල රාජධානි කාලය |
| 41 | ගඩලාදෙණිය රජමහා විහාරය | 14-15 සියවස්වල ශිලා ලිපි, වාස්තුවිද්‍යා නිර්මාණ | IV භුවනෙකබාහු |

| | පූජනීය ස්ථානයේ නාමය | පුරාවිද්‍යා සාධක | ආරම්භය පිළිබඳ පුරාවෘත්ත |
|---|---|---|---|
| 42 | ගන්නෝරුව රජමහා විහාරය | කටාර කෙටූ ගල් ගුහා | දෙවනපෑතිස් රජු, එළරුහ බෝධිය, IV භුවනෙකබාහු රජු |
| 43 | ගනේගොඩ ගංගාතිලක විහාරය | පැදුරු ගල්පොත්ත, V පරාක්‍රමබාහු රජුගේ ලිපිය | V පරාක්‍රමබාහු රජු, II රාජසිංහ රජු |
| 44 | ගම්පොළ සිරි බුවනෙකබා පිරිවෙන | - | ගම්පොළ රාජධානි කාලය |
| 45 | ගල්දොළ අශෝකාරාමය | - | එළරුහ බෝධිය, දෙවනපෑතිස් රජු |
| 46 | ගල්මඩුව ගෙඩිගේ විහාරය | පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහිත ගඩොළු | කීර්ති ශ්‍රී රාජසිංහ රජු |
| 47 | ගලබාව වේරගල විහාරය | කටාර කෙටූ ගල් ගුහා I සියවසේ බ්‍රාහ්මී ලිපි | - |
| 48 | ගල්ලෑල්ල රජමහා විහාරය | කටාර කෙටූ ගල් ගුහා | වලගම්බා රජු |
| 49 | ගල්ලෙන්ගොල්ල පොත්ගුල් විහාරය | කටාර කෙටූ ගල් ගුහා සිරිපතුල් සටහන් | - |
| 50 | ගැටඹේ පුරාණ උපසම්පදා තොටුපළ | - | දුටුගැමුණු රජු, III වික්‍රමබාහු රජු, II විමලධර්මසූරිය රජු |
| 51 | ගැටඹේ රජෝපවනාරාමය | - | සේනාසම්මත වික්‍රමබාහු රජු, I විමලධර්මසූරිය රජු |
| 52 | ගුණදාහ ලෙන් විහාරය | කටාර කෙටූ ගල් ගුහා | වලගම්බා රජු |
| 53 | ගුරුදෙණියේ පිටියේ දේවාලය ආශ්‍රිත විහාරය | I සියවසට අයත් පැරණි ස්තූපය හා බ්‍රාහ්මී අක්ෂර | නරේන්ද්‍රසිංහ රජු |
| 54 | ගුරුළුපොත සීතා කොටුව | VIII-X සියවස්වල වාස්තුවිද්‍යා ශේෂ, පධානඝර නටබුන් | රාවනා රජු සීතා දේවිය |
| 55 | ගොඩවෙල පුරාණ බෝධි විහාරය | - | II රාජසිංහ රජු |
| 56 | ගෝනිගොඩ ලෙන් විහාරය | කටාර කෙටූ ගල් ගුහා | වලගම්බා රජු |
| 57 | ගෝනවත්ත විහාරය | කටාර කෙටූ ගල් ගුහා, පූර්ව බ්‍රාහ්මී ලිපි | එළරුහ බෝධිය, දෙවනපෑතිස් රජු |

| | පූජනීය ස්ථානයේ නාමය | පුරාවිද්‍යා සාධක | ආරම්භය පිළිබඳ පුරාවෘත්ත |
|---|---|---|---|
| 58 | චන්ද්‍රමුඛී ලෙන් විහාරය | කටාර කෙටූ ගල් ගුහා | මලියදේව රහතන් වහන්සේ |
| 59 | දන්තුරේ රජමහා විහාරය | - | දෙවනපෑතිස් රජු, එලරුහ බෝධිය, I විමලධර්මසූරිය රජු. |
| 60 | දස්කර කුට්ටන්ගලේ ලෙන් විහාරය | කටාර කෙටූ ගල් ගුහා, බ්‍රාහ්මී ලිපි, සිරිපතුල් සටහන් | IV භුවනෛකබාහු රජු |
| 61 | දළදාගම මාළිගා ලෙන් විහාරය | කටාර කෙටූ ගල් ගුහා XII සියවසේ ශිලා ලිපි | - |
| 62 | දියකෙළිනාවෙල රජමහා විහාරය | කටාර කෙටූ ගල් ගුහා, සිරිපතුල් සටහන් | වලගම්බා රජු |
| 63 | දුල්වල සෝමගිරි විහාරය | කටාර කෙටූ ගල් ගුහා, පූර්ව බ්‍රාහ්මී ලිපි | - |
| 64 | දුල්වල බ්‍රාහ්මී ලිපි | කටාර කෙටූ ගල් ගුහා, පූර්ව බ්‍රාහ්මී ලිපි | - |
| 65 | දෙගල්දොරුව රජමහා විහාරය | කටාර කෙටූ ගල් ගුහා | - |
| 66 | දෙහිගම වේරගල රජමහා විහාරය | - | කීර්ති ශ්‍රී රාජසිංහ රජුට පෙර ඉදිවූවකි. |
| 67 | දෙහිපාගොඩ අග්‍රබෝධි විහාරය | නරේන්ද්‍රසිංහ රජුගේ ශිලා ලිපිය | දෙවනපෑතිස් රජු කල්‍යාණවතී රැජින සේනාධිලංකාධිකාර ඇමති |
| 68 | දෙල්දෙණිය රජමහා විහාරය | සිරිපතුල් සටහන් | කුරුණෑගල රාජධානි කාලය |
| 69 | දේදුනුපිටිය ගල්ලෙන් විහාරය | කටාර කෙටූ ගල් ගුහා | - |
| 70 | දොරගමුවේ පුරාණ ටැම්පිට විහාරය | කටාර කෙටූ ගල් ගුහා | - |
| 71 | නාපාන පුරාණ විහාරය | සිරිපතුල් සටහන් | ක්‍රි.ව. 1721 දී ඉදිවිය. නරේන්ද්‍රසිංහ රජු |
| 72 | නාරංවෙල පුරාණ විහාරය | - | ක්‍රි.ව. 1750 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජු |
| 73 | නාරංවිට පුරාණ විහාරය | - | නරේන්ද්‍රසිංහ රජු |

| | පූජනීය ස්ථානයේ නාමය | පුරාවිද්‍යා සාධක | ආරම්භය පිළිබඳ පුරාවෘත්ත |
|---|---|---|---|
| 74 | නිකතැන්නේ පුරාණ විහාරය | කටාර කෙටූ ගල් ගුහා | - |
| 75 | නිකහැටියේ ගල්ලෙන් විහාරය | කටාර කෙටූ ගල් ගුහා | වලගම්බා රජු |
| 76 | නිග්ගම්මන රජමහා විහාරය | XV සියවසේ වාස්තුවිද්‍යා ශේෂ, I විමලධර්මසූරිය රජුගේ තඹ සන්නස | III වික්‍රමබාහු රජු I විමලධර්මසූරිය රජු |
| 77 | නිත්තවෙල රජමහා විහාරය | - | නරේන්ද්‍රසිංහ රජු |
| 78 | නියංගොඩ පුරාණ විහාරය | කටාර කෙටූ ගල් ගුහා | - |
| 79 | නියම්ගම්පාය රජමහා විහාරය | XIV සියවසේ සෙල් ලිපි, පැරණි ලේඛන හා වාස්තු විද්‍යා ශේෂ | මොටැතිස රජු දෙවනපැතිස් රජු කණිට්ඨතිස්ස රජු III වික්‍රමබාහු රජු |
| 80 | නියමකන්දේ පිරිවෙන | කටාර කෙටූ ගල් ගුහා | නරේන්ද්‍රසිංහ රජු |
| 81 | නුගේතැන්න උඩගෙදර වත්ත | කටාර කෙටූ ගල් ගුහා | - |
| 82 | පට්ටපොළ ගල්ලෙන් විහාරය | කටාර කෙටූ ගල් ගුහා | - |
| 83 | පමුණුතෙන්න ලෙන | කටාර කෙටූ ගල් ගුහා | - |
| 84 | පල්කුඹුර පුරාණ විහාරය | වාස්තු විද්‍යා ශේෂ | සේනාසම්මත වික්‍රමබාහු රජු, සෙනරත් රජු |
| 85 | පල්ලේතලවින්න බෝගහපිටිය විහාරය | - | ඵලරුහ බෝධිය |
| 86 | පස්ගම රජමහා විහාරය | වාස්තු විද්‍යා ශේෂ | දෙවනපැතිස් රජු, දෙතිස් ඵලරුහ බෝධිය, වලගම්බා රජු |
| 87 | පානබොක්කේ විහාරය | සිරිපතුල් සටහන් | - |
| 88 | පින්නගොල්ල ගල්ලනේ විහාරය | කටාර කෙටූ ගල් ගුහා | - |
| 89 | පොල්ගස් අංගේ බෝධිරුක්ඛාරාමය | - | I විමලධර්මසූරිය රජු |


| | පූජනීය ස්ථානයේ නාමය | පුරාවිද්‍යා සාධක | ආරම්භය පිළිබඳ පුරාවෘත්ත |
|---|---|---|---|
| 90 | බඹරගල රජමහා විහාරය | කටාර කෙටූ ගල් ගුහා, පූර්ව බ්‍රාහ්මී ලිපි | - |
| 91 | බුලුගහතැන්න සිසිල්පැන්වල විහාරය | සිරිපතුල් සටහන | IV භුවනෙකබාහු රජු |
| 92 | බොල්ලෑගල විහාරය | - | II රාජසිංහ රජු |
| 93 | මාන්ගමුව උඩවිහාරය | - | III වික්‍රමබාහු රජු හෙනකඳබිසෝ බණ්ඩාර |
| 94 | මාපනාවතුර ගල්ලෙන් විහාරය | කටාර කෙටූ ගල් ගුහා | - |
| 95 | මාලගම්මන රජමහා විහාරය | - | V භුවනෙකබාහු රජු |
| 96 | මාලතීමාල සිලාතලාව | XIV සියවසේ වාස්තුවිද්‍යා ශේෂ | IV භුවනෙකබාහු රජු |
| 97 | සිංහපිටියේ ගල්ලෙන් උපාසිකාරාමය | කටාර කෙටූ ගල් ගුහා XIV සියවසේ වාස්තුවිද්‍යා ශේෂ | IV භුවනෙකබාහු රජු ධර්මකීර්ති හිමි |
| 98 | මාවතුර පුරාණ ගල්විහාරය | වාස්තුවිද්‍යා නටබුන් | - |
| 99 | මැණික්දිවෙල රජමහා විහාරය | - | දෙවනපෑතිස් රජු IV භුවනෙකබාහු රජු |
| 100 | මැදගොඩ රජමහා විහාරය, දොළපිල්ල | කටාර කෙටූ ගල් ගුහා බ්‍රාහ්මී ලිපි | වලගම්බා රජු |
| 101 | මැදවෙල රජමහා විහාරය | වාස්තුවිද්‍යා නිර්මාණ XIV සියවසේ ශිලා ලිපි, කීර්ති ශ්‍රී රාජසිංහ තඹ සන්නස | වලගම්බා රජු IV පරාක්‍රමබාහු රජු III වික්‍රමබාහු රජු |
| 102 | මිණිගමුවේ ටැම්පිට විහාරය | - | ක්‍රි.ව. 1744 ආරම්භ විය. |
| 103 | මුල්ගම පුරාණ විහාරය | - | IV භුවනෙකබාහු රජු |
| 104 | මොලගොඩ | කටාර කෙටූ ගල් ගුහා පූර්ව බ්‍රාහ්මී ලිපි | වලගම්බා රජු |
| 105 | රංගොඩ පුලිනතලාරාමය | සිරිපතුල් සටහන් | - |
| 106 | රණවන බෝධිමළු විහාරය | - | I රාජසිංහ රජු |

| | පූජනීය ස්ථානයේ නාමය | පුරාවිද්‍යා සාධක | ආරම්භය පිළිබඳ පුරාවෘත්ත |
|---|---|---|---|
| 107 | රණවන ලෙන් විහාරය | කටාර කෙටූ ගල් ගුහා සිරිපතුල් සටහන | - |
| 108 | රත්මල්කඩුවේ බෝධිරුක්ඛාරාමය | කටාර කෙටූ ගල් ගුහාව | IV භුවනෙකබාහු රජු |
| 109 | රාම විහාරය | - | IV පරාක්‍රමබාහු රජු<br>IV භුවනෙකබාහු රජු |
| 110 | ලංකාතිලක රජමහා විහාරය | XIV සියවසේ ශිලා ලිපි, සන්නස්, වාස්තුවිද්‍යා නිර්මාණ, සිරිපතුල් සටහන් | IV භුවනෙකබාහු රජු<br>VI පරාක්‍රමබාහු රජු |
| 111 | යටිවාවල රාජසිංහාරාමය | කටාර කෙටූ ගල් ගුහා | I රාජසිංහ රජු |
| 112 | යාලේගොඩ පුරාණ විහාරය | - | V භුවනෙකබාහු රජු |
| 113 | වලපුලුව ඇඹල රජමහා විහාරය | - | නරේන්ද්‍රසිංහ රජු |
| 114 | වල්ගම්පාය රජමහා විහාරය | - | III පරාක්‍රමබාහු රජු<br>IV විජයබාහු රජු |
| 115 | වල්ගම බෝධිකොටුව විහාරය | - | IV භුවනෙකබාහු රජු |
| 116 | වල්වාසගොඩ දේවාලය | පැරණි ස්තූප නටබුන් | V භුවනෙකබාහු රජු |
| 117 | වලල පුරාණ ටැම්පිට විහාරය | - | කීර්ති ශ්‍රී රජුගේ කාලයට පෙර |
| 118 | වෙහෙරගල කන්දේ ස්තූපය | පැරණි ස්තූප නටබුන් | දුටුගැමුණු රජු |
| 119 | වෙලගම ගල්ලෙන් විහාරය | - | වලගම්බා රජු |
| 120 | වේගිරිය තොරණපිටිය විහාරය | පැරණි ස්තූපය | - |
| 121 | වේගිරිය කන්දේ ගල් ගුහා | කටාර කෙටූ ගල් ගුහා, පූර්ව බ්‍රාහ්මී ලිපි | - |
| 122 | වේගිරිය නාථ දේවාලය | XVII සියවසේ වාස්තුවිද්‍යා නිර්මාණ, XV සියවසේ ශිලා ලිපි, කටාර කෙටූ ගල් ගුහා | IV භුවනෙකබාහු රජු<br>III වික්‍රමබාහු රජු |

| | පූජනීය ස්ථානයේ නාමය | පුරාවිද්‍යා සාධක | ආරම්භය පිළිබඳ පුරාවෘත්ත |
|---|---|---|---|
| 123 | වේරවල මතිනාරාමය | සිරිපතුල් සටහන් | - |
| 124 | වේරවල සීමාරාමය | කටාර කෙටූ ගල් ගුහා | III වික්‍රමබාහු රජු හෙනකඳබිසෝ බණ්ඩාර |
| 125 | සගම රජමහා විහාරය | XIV සියවසේ ශිලා ලිපි | දෙවනපෑතිස් රජු අෂ්ට ඵලරුහ බෝධිය |
| 126 | සියඹලාපාය කොහොඹා දේවාලය | කටාර කෙටූ ගල් ගුහා | පැරණි විහාරයක් වීමට පිළිවන |
| 127 | සිරිමල්වත්ත රජමහා විහාරය | - | දෙවනපෑතිස් රජු II විමලධර්මසූරිය රජු |
| 128 | සෙංකඩගලඋඩවත්තකැලේ | කටාර කෙටූ ගල් ගුහා | දෙවනපෑතිස් රජු |
| 129 | සෙංකඩගල නාථ දේවාලය | XIV සියවසේ වාස්තුවිද්‍යා නිර්මාණ, ශිලාලිපිය | දෙවනපෑතිස් රජු, ඵලරුහ බෝධිය, වීරවික්‍රම රජු, III වික්‍රමබාහු රජු |
| 130 | සෙල්ලාවලී විහාරය, පල්ලේගම | වාස්තුවිද්‍යා ශේෂ, සිරිපතුල් සටහන් | II විමලධර්මසූරිය රජු |
| 131 | සූරියගොඩ රජමහා විහාරය | සිරිපතුල් සටහන්, පැරණි ලේඛන | VI පරාක්‍රමබාහු රජු I විමලධර්මසූරිය රජු |
| 132 | හත්නාගොඩ විහාරය | - | I විමලධර්මසූරිය රජු III වික්‍රමබාහු රජු |
| 133 | හන්තානේ නාගවිමාන විහාරය | - | IV භුවනෙකබාහු රජු |
| 134 | හන්දෙස්සේ විහාරය | සිරිපතුල් සටහන් | III වික්‍රමබාහු රජු හෙනකඳබිසෝ බණ්ඩාර |
| 135 | හපුගොඩ ලෙන් විහාරය | කටාර කෙටූ ගල් ගුහා, ලේඛන | I රාජසිංහ රජු |
| 136 | හීයවෙල පුරාණ විහාරය | - | ගම්පොළ රාජධානි කාලය |
| 137 | හේන්දෙණිය රජමහා විහාරය | කටාර කෙටූ ගල් ගුහා | III වික්‍රමබාහු රජු හෙනකඳබිසෝ බණ්ඩාර |

| | | | |
|---|---|---|---|
| 138 | හිඳගල රජමහා විහාරය | කටාර කෙටූ ගල් ගුහා,<br>VII සියවසේ චිත්‍ර ශිලා ලිපි | වලගම්බා රජු |
| 139 | ශ්‍රී දළදා මාළිගය | පැරණි දළදා මාළිගය | II විමලධර්මසූරිය රජු<br>II රාජසිංහ රජු<br>නරේන්ද්‍රසිංහ රජු |

(මූලාශ්‍ර : අබේවර්ධන 1978; තුන්දෙණිය 1986a; 1986b; 1988a; 1988b; 1990a; 1990b; 1990c; 1990d;1998; ධම්මානන්ද හිමි 1969; නිකලස් 1979; පරණවිතාන 1970; 1972; පැරණි ස්මාරක 1972; පුරාවිද්‍යා කොමසාරිස් 1933; 1938; 1940-45; 1953; 1959; 1961-62; 1964-65; 1965-66; 1966-67;1967-68; බුද්ධශාසන 1959; මුදියන්සේ 1963; 1971; ලෝරි 1896; 1898; සාරානන්ද හිමි 1956; සෙනෙවිරත්න, ඒ. 1989)



*ඡායාරූපය 01. ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ අස්ගිරිය විජේසුන්දරාරාම ශිලා ලිපිය*



ඡායාරූපය 02. හිඳගල රජමහා විහාරය




ඡායාරූපය 03. මහනුවර නාථ දේවාල ශිලා ලිපිය




*ඡායාරූපය 04. මහනුවර උඩවත්තකැලේ කටාර කෙටූ පැරණි ගල් ගුහාවක්*



*ඡායාරූපය 05. ගඩලාදෙණිය රජමහා විහාර පුවරු ලිපිය*




ඡායාරූපය 06. මහනුවර නාථ දේවාලය



ඡායාරූපය 07. උඩුනුවර ලංකාතිලක රජමහා විහාරය



*ඡායාරූපය 08. මහනුවර පෝය මළු විහාරය*




*ඡායාරූපය 09. හිඳගල රජමහා විහාර ගිරි ලිපිය*

## විමර්ශන ග්‍රන්ථ නාමාවලිය


ආර්යසිංහ, ඒ. 1965, **Sinhalese Paleography**, Unpublished Ph.D. Thesis, University of London.

***කඩඉම් පොත් විමර්ශනය,*** 1978, එච්.ඒ.පී. අභයවර්ධන සංස්කරණය, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, කොළඹ.

ගුණවර්ධන ආර්.ඒ.එල්.එච්. 1985, Prelude to the, An Early Phase in the Evolution of Political Institutions in Ancient Sri Lanka, **The Sri Lanka Journal of the Humanities**, Vol VIII Numbers 1 and 2 University of Peradeniya, PP. 1-39.

**චුල්ල බෝධිවංසය,** 1923 දොන් දාවින් කරුණාතිලක සංස්කරණය, කෑගල්ල.

තුන්දෙණිය එච්.එම්.එස්.

1986a - ***උඩුනුවර විහාර වංසය***

1986b - ***යටිනුවර විහාර වංසය***

1988 a - ***මහනුවරවිහාර වංසය***

1988 b - ***උඩපළාතවිහාර වංසය*** — අප්‍රකාශිත පර්යේෂණ ග්‍රන්ථ, ***පේරාදෙණිය*** විශ්වවිද්‍යාලයීය ප්‍රධාන පුස්තකාලය, පේරාදෙණිය

1990 a - ***දුම්බර විහාර වංසය***

1990 b - ***හාරිස්පත්තුවේවිහාර වංසය***

1990 c - ***තුම්පනේවිහාර වංසය***

1990 d - ***දුම්බරවිහාර වංසය***

1998 - ***උඩුනුවර විහාර විත්ති***, මධ්‍යම පළාත් සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, මහනුවර.

දීපවංස, 1959, ***සිංහලානුවාද සහිත දීපවංශය***, කිරිඇල්ලේ ඥානවිමල හිමි සංස්කරණය, සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගමය, කොළඹ.

ධම්මානන්ද හිමි, එන්. 1969, ***මධ්‍යම ලංකා පුරාවෘත්ත***, සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

නිකලස් සී.ඩබ්ලිව් 1979, ***පුරාතන සහ මධ්‍යතන ලංකාවේ ඓතිහාසික ස්ථාන විස්තරය***, Historical Topography of Ancient and Medieval Ceylon, Journal of the Ceylon Branch of the Royal Asiatic Society, New Series Vol VI Special Number 1963 ග්‍රන්ථයේ සිංහල පරිවර්තනය සෝමපාල ජයවර්ධන, තිසර පොත් ප්‍රකාශකයෝ, කොළඹ.

Paranavithana, S. 1958, ***The Hindagala Rock Inscription***, **University of Ceylon Review** Vol XVI Nos 1-2, Peradeniya, PP 1-5.

Paranavithana, S. 1970, **Inscriptions of Ceylon** Vol. 1, Archaeological Survey of Ceylon, Departmenr of Archaeology, Colombo.

***පාලි මහාබෝධිවංශය*** 1996, වැගම පියරතන හිමි සංස්කරණය, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

***පැරණි ස්මාරක,*** 1972, පැරණි ස්මාරක නාමාවලිය, සංස්කෘතික අමාත්‍යාංශය, කොළඹ.

***පුරාවිද්‍යා කොමසාරිස් වාර්ෂික වාර්තා*** 1933; 1938; 1940-45; 1953; 1959; 1961-62; 1964-65; 1965-66; 1966-67; 1967-68, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ.

පෙරේරා, එල්.එස්. 1964, ***ලංකා ඉතිහාසයේ මූලාශ්‍රයයෝ ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය*** I කාණ්ඩය I භාගය, ප්‍රධාන සංස්කාරක හේමචන්ද්‍ර රායි, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ පර්යේෂණාංශයේ සිංහල පරිවර්තනය, පිටු 46-72.

බියර්ස්, වී. 1992 (Biers, Villiam R) **Art, Artifacts and chronology in Classical Archaeology**, Routledge, London.

**බුද්ධ ශාසන කොමිෂන් සභා වාර්තාව** 1959, XVIII වැනි සැසි වාර්තාව, ලංකාණ්ඩුව, කොළඹ.

බ්‍රෝත්වෙල් දොන් සහ එරික් හිග්ස් 1963, (Brothwell Don and Eric Higgs) ***Science in Archaeology,*** A Comprehensive Survey of Progress and Research, London.

මහාවංසො 1959, ***උභනපුරණසහිතො මහාවංසො*** අම්බලන්ගොඩ පොල්වත්තේ බුද්ධදත්ත මහාථෙර සංස්කරණය, සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගමය, කොළඹ.

මුදියන්සේ, එන්. 1963, ***The Art and Architecture of the Gampola Period,*** M.D. Gunasena and Co. Ltd, Colombo.

මුදියන්සේ, එන්. 1971, ***ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය,*** සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගමය, කොළඹ.

***රාජාවලිය*** 1997, ඒ.වී. සුරවීර සංස්කරණය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

රාහුල හිමි වල්පොල, ශ්‍රී. 1962, ***ලක්දිව බුදුසමයේ ඉතිහාසය,*** සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

ලෝරි, ඒ.සී. 1896, ***A Gazetteer of the Central Province of Ceylon,*** Vol. I. George J.A. Skeen, Government Printer of Ceylon, Colombo.

ලෝරි, ඒ.සී. 1898, ***A Gazetteer of the Central Province of Ceylon,*** Vol. II. George J.A. Skeen, Government Printer of Ceylon, Colombo.

***වංසත්ථප්පකාසිනී*** 1994, වංසත්ථප්පකාසිනී මහාවංස ටීකාව සිංහල අනුවාදය, අකුරැටියේ අමරවංස නාහිමි සහ හේමචන්ද්‍ර දිසානායක සංස්කරණය, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, කැලණිය.

වික්‍රමසිංහ, එස්. 1961, ***ඓතිහාසික මූලාශ්‍ර,*** අනුරාධපුර යුගය, සංස්කාරක වරු අමරදාස ලියනගමගේ සහ රණවීර ගුණවර්ධන, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයීය මුද්‍රණාලය, කැලණිය, පිටු 5-9.

***සමන්තපාසාදිකා*** 1999, පාලි සමන්තපාසාදිකා බාහිර නිදාන, සුචරිත ගම්ලත් සංස්කරණය, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

සාරානන්ද හිමි පන්නිල සහ ඕපාත සරණංකර හිමි, 1956, ***විවරණ සහිත නම් පොත හෙවත් විහාර අස්න***, ප්‍රකාශක තිස්ස ගුණසේකර, තිලක මුද්‍රණාලය, අගලවත්ත.

***සුළු බෝධිවංසය***, 1991, සෝමපාල ජයවර්ධන සංස්කරණය, සිංහල පුස්තක සමිතිය, නුගේගොඩ.

***සුළු රාජාවලිය***, 1959, ඩී.පී.ආර්. සමරනායක සංස්කරණය, සීමාසහිත ශ්‍රී ප්‍රෙස් සමාගමය, කොළඹ.

සෙනෙවිරත්න, එන්. 1989, ***කන්ද උඩරට මහනුවර***, 1993 දී පළකළ ඉංග්‍රීසි පොතේ පරිවර්තනය, වැතර මහින්ද හිමි, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.

සෙනෙවිරත්න, එස්. 1954, ***The Archaeology of the Megalithic Black and Red Ware Complex in Sri Lanka,*** **Ancient Ceylon** No.5, 1984, Journal of the Archaeological Survey Department of Sri Lanka, Colombo, PP 237-307.

සේනානායක, පී. 2002, ***ශ්‍රී ලංකාවේ පැරණි ම ලේඛන සහ ඒවායේ ආරම්භය පිළිබඳ ව අදහසක්,*** ඉඳුවර පර්යේෂණාත්මක ලේඛන සංග්‍රහය, ඉතිහාසය, සංස්කාරකවරු, දයා අමරසේකර සහ රෝහිත දසනායක, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල පිටු 35-75.